**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2021**

## 1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස සමාගම පත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය රු.246,939,587 ක් වූ අතර, එම ශේෂයෙන් රු. 88,939,587 ක මුදලක් 2021 වසර අවසන් වන විටත් හිඟව පැවතුණි. | සටහන් කරගන්නා ලදි අපි මේ වන විට ඉල්ලීම් ගණනාවක් සිදුකර ඇත. නවතම ඉල්ලීම 2022.05.27 දින සිදුකරන ලදී. | සමාගම භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල අයකරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාගමේ ශුද්ධ ලාභය 2020 දී රු.මිලියන 608 සිට 2021 දී රු.මිලියන 6 දක්වා අඩු වී තිබුණි. එබැවින්, රු.මිලියන 602 ක් හෙවත් මූල්‍ය ප්‍රතිඵලයෙන් සියයට 99.01 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධානතම හේතුව වූයේ පෙර වසර හා සසඳන විට ලාභ හා අලාභය තුළින් සාධාරණ අගයකින් යුත් මූල්‍ය උපකරණවලින් රු.මිලියන 1,087 ක හෙවත් සියයට 230 ක ශුද්ධ අලාභයක් ලැබීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය, පෙර වසර හා සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ ඇගයීමට ලක් කෙරේ.

| විස්තරය | විචලනය හිතකර/ (අහිතකර) (රු.) | විචලනය (%) | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| පොලී ආදායම | (58,474,269) | (3.9) | 2021 වර්ෂයේ සමහර ඉහළ කූපන් බැඳුම්කරවල කල්පිරීම. |
| පොලී වියදම | (98,319,993) | (10) | ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමේ පොලිය අඩුවීම. |
| ගාස්තු ආදායම | (3,096,655) | (5.87) | 2021 වර්ෂය තුළ භාරකාර ගිවිසුම සම්පූර්ණ වීම. |
| ශුද්ධ වෙළඳ ලාභය/ (අලාභය) | (1,087,037,762) | (230.47) | 2021 දී වෙළඳපල පොලී අනුපාත වැඩි වීම. එබැවින්, කළඹෙහි සාමාන්‍ය වෙළඳපල ඵලදාව වසර ආරම්භයේදී 5.62% සිට වසර අවසානයේ 9.27% දක්වා මූලික අගයන් (bps) 365 කින් වැඩි වී ඇත. |
| පුද්ගලික පිරිවැය | 10,803,121 | 38.15 | ස්ථිර කාර්යමණ්ඩලය සඳහා 15.5% ක සාමාන්‍යය අගයකින් වැටුප් සංශෝධනය කිරීම, දැනට සිටින කාර්යමණ්ඩලයට උසස්වීම් ලබාදීම සහ 2021 වර්ෂයේදී නව සේවකයින් හතර දෙනෙකු බඳවා ගැනීම. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

අංශයේ අනුපාත හා සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විස්තරය | අංශයේ | | සමාගමේ | |
|---|---|---|---|---|
| | 2021 | 2020 | 2021 | 2020 |
| ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) (%) | -3.2 | 30.5 | 0.17 | 16.96 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) (%) | -0.7 | 7.6 | -0.13 | 5.48 |
| බර තැබූ අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (RWCAR) (%) (අවම 10%) | 42.8 | 27 | 22.36 | 35.01 |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>තනතුරේ ස්වභාවය, වගකීම් සහ අයිතිවාසිකම්, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, බඳවා ගැනීමේ ක්‍රමය යනාදිය ඇතුළත් වන පරිදි සේවකයින් සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) සමාගමට නොතිබුණි.</td><td>ස්ථිර හෝ කොන්ත්‍රාත් තනතුරු සඳහා වන සියලුම පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් බැංකු කාර්යමණ්ඩලය භාවිතා කර ද්විතීය පදනම මත සම්පූර්ණ කරන්නේ නම් බැංකුවේ මානව සම්පත් සංවර්ධන අංශය (HRD අංශය) හරහා එය සිදු කළ යුතු අතර එය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කළ යුතුය.<br><br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ස්ථිර හෝ කොන්ත්‍රාත් තනතුරු සඳහා නව බඳවා ගැනීම් සඳහා වන සියලුම පුරප්පාඩුවලට බඳවා ගැනීම් සෘජුව සිදු කරන්නේ නම්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ මානව සම්පත් සහ වේතන කමිටු මණ්ඩලය (BHRRC) හරහා සිදු කළ යුතුය.<br><br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනටමත් අනුමත කර ඇති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමෙහි මානව සම්පත් ප්‍රතිපත්තියේ (පිටු අංක 04 හි) බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය ඇතුළත් වේ.</td><td>සමාගම විසින් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස්වීම්, සුදුසුකම්, පළපුරුද්ද යනාදිය ඇතුළත් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) කඩිනමින් සකස් කළ යුතුය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගමේ මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ඉටු කිරීම සඳහා නම් කරන ලද නිලධාරියෙකු නොමැතිව පැවතුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණසමාගම විසින් මානව සම්පත් කාර්යයන් ඉටු කිරීම සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | මානව සම්පත් කාර්යයන් සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| (ඇ) | සමාගම ඉදිරි, මධ්‍යම සහ පසු කාර්යාලය යටතේ සිය මෙහෙයුම් සිදු කරන නමුත්, නිසි පාලනයක් යටතේ මූල්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් සහිත වෙනම මූල්‍ය අංශයක් නොතිබුණි. | ගණකාධිකාරී (එච්.එන්.ඕ.එම්. සෝමසිරි) සහ ආයෝජන සහකාර-III (ඒ.ඒ.කෙ. වීරසේකර) හට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ මූල්‍ය කාර්යයන් ඉටු කිරීම දැනටමත් පවරා ඇත. තවද, 2022/10/12 දින පැවති එහි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙන් ද්විතීය පදනම මත සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමට අනුමැතිය ලබාදුන් අතර, ඉන් එක් සේවකයෙකු විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ මූල්‍ය කටයුතු සිදුකිරීමට නියමිතය. | මූල්‍ය කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා වෙනම මූල්‍ය අංශයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඈ) | 2020-2021 කාලසීමාව තුළ සමාගම විසින් සේවකයින් 07 දෙනෙකු බඳවාගෙන ඇති අතර එම බඳවාගත් සේවකයින්ගෙන් 06 දෙනෙකු (සියයට 85 ක්) 2021-2022 කාල සීමාව තුළ සමාගමෙන් ඉල්ලා අස්වී ඇති බව නිරීක්ෂණය විය. සමාගමේ ඉහළ කාර්යමණ්ඩල පිරිවැටුම අඩු කිරීමට අවධානය යොමු කර නොතිබුණි. | විදේශගතවීම, වැටුප් මට්ටම සහ පුද්ගලික කාරනා ආදිය සේවකයින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමෙන් ඉල්ලා අස්වී තිබුණි.<br><br>ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් පුරප්පාඩු වූ තනතුරු සඳහා නව සේවකයින් බඳවා ගැනීමට පියවර ගෙන ඇත. තවද, සේවක පිරිවැටුම ආමන්ත්‍රණය කිරීම සඳහා සමාගම කාර්යමණ්ඩලයේ වැටුප් මට්ටම් සංශෝධනය කර ඇත. | කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාතය අවම කළ යුතුය. |
| (ඉ) | සමාගමේ කළමනාකරණ කමිටුව, බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් සමන්විත වන බැවින් සමාගමේ කළමනාකරණ කමිටුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා ස්ථාපිත කරන ලෙස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරීවරයාට උපදෙස් දී තිබුණි. ඉන් අනතුරුව, ඉහත කාරණය සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් 2021 මාර්තු 08 දිනැතිව අභ්‍යන්තර සංදේශයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් කළමනාකරණ කමිටුව කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත. | කළමනාකරණ කමිටු ස්ථාපිත කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වෙත යවා ඇති අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2021 මාර්තු 30 දින අංක 108/2021 මණ්ඩල පත්‍රිකාවට අදාළව අනෝන්‍ය වශයෙන් සටහන් තබා ඇත. කෙසේ වෙතත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත් කිරීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | | |
| (ඊ) | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භාණ්ඩාගාර පසු කාර්යාලයට (NSB Treasury Back Office) මාස 03ක් සඳහා නිදහස් කරන ලද නිලධාරියෙකුගේ (ආයෝජන සහකාර II) රාජකාරි ආවරණය කිරීම සඳහා අභ්‍යාසලාභියෙකු බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත්, එම නිලධාරියාගේ ඉල්ලා අස්වීමෙන් පසු, එම අභ්‍යාසලාභියා 2022 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොන්ත්‍රාත් පදනම මත මාස හයක කාලයක් සඳහා ආයෝජන සහකාර II තනතුරට පත් කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.<br><br>i. ඉහත කී අභ්‍යාසලාභියා 2021 නොවැම්බර් 11 සිට 2022 අප්‍රේල් 10 දක්වා මාස 06ක් සේවයේ යොදවා ඇති අතර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් 2022 ජුනි 01 දින නැවත පත්වීම ලබා දෙන ලදී. මේ අනුව, මෙම නිලධාරියා 2022 අප්‍රේල් 11 සිට මැයි 31 දක්වා කාලය තුළ නීත්‍යානුකූල පත්වීමකින් තොරව සේවයේ යොදවා තිබුණි.<br><br>ii. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය, ආයතනික සැලසුම් සහ MIS) ගේ ඉල්ලීම මත, 2022 ජනවාරි 20 වන දින ආයෝජන සහකාර-II නිලධාරියා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භාණ්ඩාගාර කාර්යාලයට නිදහස් කර ඇති අතර එකී නිලධාරියාගේ රාජකාරි ආවරණය කිරීම සඳහා අභ්‍යාසලාභියෙකු බඳවා ගැනීමට | • බියුමාල් දිසානායක මහතා 2021/11/11 දින “පුහුණුවන්නෙකු” ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම සමඟ සම්බන්ධ විය.<br>• ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022/02/01 දින පැවති රැස්වීමේදී ගයානි සෙව්වන්දි මහත්මිය (ආයෝජන සහකාර III) මාස 03ක කාලයක් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භාණ්ඩාගාර පසු කාර්යාලය වෙත තාවකාලික පදනමින් මුදා හැරීමට සහ පසු කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ අධීක්ෂණය යටතේ ඉහත නිලධාරී - ආයෝජන සහකාර III ගේ රාජකාරි ආවරණය කිරීම බියුමාල් දිසානායක මහතා (අභ්‍යාසලාභී) වෙත පැවරීමට අනුමැතිය ලබා දෙන ලදී.<br>• පුහුණු කාලය අවසන් වීමත් සමඟ, පසු කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ නිර්දේශය සැලකිල්ලට ගනිමින් සහ පුහුණු කාලය තුළ කාර්යසාධනය මත පදනම්ව, 2022.05.01 දින සිට බලපැවැත්වෙන පරිදි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ආයෝජන සහකාර ලෙස බියුමාල් දිසානායක මහතා අන්තර්ග්‍රහණය කර ගැනීමට නිර්දේශ ලබා ගැනීම සඳහා පත්‍රිකාවක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් 2022/04/12 දිනැතිව මානව සම්පත් සහ වේතන කමිටු මණ්ඩලය (BHRRC) වෙත ඉදිරිපත් කර ඇත.<br>• ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ BHRRC විසින් | එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රම සහ උසස්වීම්, සුදුසුකම්, පළපුරුද්ද යනාදිය සඳහන් කරන විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය (SOR) යටතේ සමාගම විධිමත් බඳවා ගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. |

2022 පෙබරවාරි 01 වැනි දින ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම අනුමැතියට පෙර මෙම අභ්‍යාසලාභියා 2021 නොවැම්බර් 11 වැනි දින සමාගමට බඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය.

2022/05/19 දින පැවති රැස්වීමේදී ඉදිරිපත් කරන ලද පත්‍රිකාව සමාලෝචනය කර එහි නිර්දේශය/අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉරිපත් කර ඇත.

- BHRRC හි නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022/05/20 දින පැවති රැස්වීමේදී 2021/11/11 දින සිට බලපැවැත්වෙන පරිදි "ආයෝජන සහකාර" ලෙස බියුමාල් දිසානායක මහතා අන්තර්ග්‍රහණය කිරීමට යෝජනා කළේය.
- අනතුරුව, බියුමාල් දිසානායක මහතා මුලදී පුහුණුවන්නෙකු ලෙස සමාගමට සම්බන්ධ වූ බැවින් සහ ඔහුට පැමිණීමේ දීමනාවක් ගෙවන ලද බැවින් 2021.11.11 දින සිට කොන්ත්‍රාත් පදනම මත ඔහුව ආයෝජන සහකාර තනතුරට අන්තර්ග්‍රහණය කරගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවය පිළිබඳව 2022/05/24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පැහැදිලි කරන ලදි. එබැවින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් 2022.05.01 දින සිට මාස 06ක කොන්ත්‍රාත්තු කාලයක් සඳහා ඔහුගේ කොන්ත්‍රාත් කාලය සලකා බැලීමට යෝජනා කරන ලදි.
- ඒ අනුව, මාස 06ක කොන්ත්‍රාත් කාලයට යටත්ව 2022/05/01 දින සිට ආරම්භ වන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ආයෝජන සහකාර ලෙස බියුමාල් දිසානායක මහතා අන්තර්ග්‍රහණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කර අනුමත කරන ලදී.
- 2022/05/01 දිනෙන් ආරම්භ වන මාස හයක කොන්ත්‍රාත් කාලයට යටත්ව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ‘‘ආයෝජන සහකාර’’ ලෙස බඳවා ගන්නා බව දන්වමින් බියුමාල් දිසානායක මහතාගේ පත්වීම් ලිපිය 2022/06/01 දින නිකුත් කර ඇත.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අංක 01 දරන හා 2019 දෙසැම්බර් 01 දිනැති ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනතේ සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ උපදෙස්වල 7.1 (iii) වගන්තිය ප්‍රකාරව ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිමිල මිලදී ගැනීම් ගනුදෙනු සඳහා සෘජු අලෙවි නියෝජිතයින්ගේ ප්‍රතිපත්තිය විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සමාගම එයට අනුගත වී නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. අපි 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කරන්නෙමු. අපි 2021 කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී එම ගැටලුව හඳුනාගෙන තිබුණේ නම් අපට එය එයට ඇතුළත් කළ හැකිව තිබුණි. | මෙහෙයුම් සිදු කිරීමේදී සමාගම අදාළ රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |
| (ආ) | ගනුදෙනු ප්‍රවේශපත්‍ර සඳහා අවසරයක් ලබා නොදුන් අවස්ථා සහ ගනුදෙනු ප්‍රවේශ පත්‍ර සංක්ෂිප්ත වනවිට අනුමත මෙහෙයුම් අත්පොත වෙත ගනුදෙනු යොමු අංකය තබා නොතිබූ අවස්ථා පැවතුනි. | සටහන් කරගන්නා ලද අතර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | සමාගම කලින් සකස්කර ඇති විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවලට අනුගත විය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වාදීමට 2019 වර්ෂයේදී සමාගම සැලසුම් කර තිබුණද, එය මෙතෙක් හඳුන්වා දී නොමැත. | පාරිභෝගික කළමනාකරණ පද්ධතිය 2022 දී ක්‍රියාත්මක කරන අතර කැමත්තක් දක්වන පාරිභෝගිකයින්ට මාර්ගගත වේදිකාව හරහා සම්බන්ධ විය හැක. | සැලසුම් කරන ලද කාල සීමාව තුළ සැලසුම් කළ ක්‍රියාකාරකම් සමාගම විසින් සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | අභ්‍යන්තර ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමේ අරමුණින් සමාගම විසින් 2019 වන විට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් අත්පත් කරගැනීමටත්, 2020 වන විට පර්යේෂණ සහ සංවර්ධන ඒකකයක් නිර්මාණය කිරීමටත් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, විගණිත දිනය වන 2022 ජුනි මස දක්වාම ඉහත අරමුණු සම්පූර්ණ කරගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. | ලොව පුරා පැවතුනු Covid 19 වසංගතය හේතුවෙන් භාණ්ඩාගාර පද්ධති සංවර්ධනය කිරීමට පවරා ඇති තාක්ෂණික කාර්යමණ්ඩලය නැවත ඉන්දියාවට ගොස් ඇති අතර ඔවුන්ගේ කණ්ඩායම කිහිප වතාවක්ම වෙනස් කර ඇත. ඒ හේතුවෙන් අපේක්ෂා කළ පරිදි සංවර්ධනය කිරීමේ කටයුතු වේගයෙන් සිදු නොවුනි. කෙසේ වෙතත්, අපි සජීවී පද්ධතියට සංක්‍රමණය වීමට 2022.09.30 ට දත්ත ලබා දී ඇති අතර 2022 දෙසැම්බර් මාසයේදී සජීවී තත්වයට පැමිණීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වෙමු. | නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය කඩිනමින් අවසන් කළ යුතුය. |